රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක: 330

රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය,
කොළඹ 7.
1986 ජූනි මස 24 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන් වෙත,

**පරිපාලනයෙහි සේවක නියෝජිතයින් - අමාත්‍යාංශවල සහකාර ලේකම්වරුන් (ශ්‍රී.ලං.ප.සේ.නොවන) තනතුරු**

1979.06.14 දිනැති අංක 315 දරණ ආයතන චක්‍රලේඛය හා බැඳේ.

02. 1986 මැයි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පරිපාලනයෙහි සේවක නියෝජිතයන් - අමාත්‍යාංශ සහකාර ලේකම්වරුන් (ශ්‍රී.ලං.ප.සේ.නොවන), සේවයෙහි යෙදවීමේ කොන්දේසි පහත දැක්වෙන පරිදි වේ.

(අ) මෙම තනතුර ස්ථිර සහ විශ්‍රාම වැටුප් සහිත වන අතර, අවුරුදු තුනක සතුටුදායක සේවයකින් පසුව, හා 1956 අංක 33 දරණ රාජ්‍ය භාෂා පණතෙහි අවශ්‍යතාවයන් සපුරාලීමෙන් අනතුරුව පත්වීම ලබන්නා, සේවයෙහි ස්ථිර කරනු ලැබේ.

(ආ) එසේ ස්ථිර කර ඇති අමාත්‍යාංශයක සහකාර ලේකම් වරයෙකු, (පරිපාලනයෙහි සේවක නියෝජිතයෙකු)

(I) සහකාර ලේකම් ධූරය දරණ අමාත්‍යාංශය භාර අමාත්‍යවරයාට අවශ්‍ය නොවන්නාවූ හෝ

(II) වෙනත් අමාත්‍යාංශයක සමාන තනතුරකට පත්කිරීමට නොහැකි වන්නාවූ හෝ

(III) තමා කලින් දැරූ තනතුරට පෙරළා යාමට අකැමැති වන්නාවූ හෝ

අවස්ථාවක, 1979.04.17 දිනැති අංක. 136 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයෙහි ආ.(I) වගන්තියෙහි විධිවිධාන අනුව කටයුතු කොට, විනය ක්‍රියාමාර්ගය අනුගමනය කිරීමකින් තොරව, විශ්‍රාම ලැබීමට ඔහුට අවස්ථාව ලබාදිය යුතුය.

බී.බී.අයි.පී.එස්.සිරිවර්ධන
ලේකම්,
රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය.